


එච්.ඒ. ලවිණා ජයිනි

AMP Print Shop

# අපි නැගිටිමු

## එච්.ඒ. ලවිණා ජයිනි

කතෘ

## කතෘගේ වෙනත් කෘති

මා ගිය චාරිකා පොජ්ජ
අධ්‍යාපන චාරිකාව

## පාසල

මප/ලැගුම්දෙණිය ප්‍රාථමික විදුහල

4 වන ශ්‍රේණිය

2026-06-03

ISBN 978-624-211-429-3



AMP Print Shop

# පිදුම

මාගේ ගමන් මඟ සෙවණැල්ල සේ සිටින අම්මා, අප්පච්චි සේම මේ දක්වා මා හට යෝධ ශක්තියක් වන ලැගුම්දෙණිය ප්‍රාථමික විදුහලේ ගරු විදුහල්පතිතුමා, ගුරු මෑණිවරු සියලු දෙනාට මාගේ ගෞරවණීය ප්‍රණාමය පුද කරන අතර

මහාමායා බාලිකාවේ ගරු විදුහල්පතිතුමිය, සෙනවිරත්න මහලේකම් ගුරු පියාණන් හා තනූජා රත්නායක මහත්මියද මා නිතරම දිරිගන්වන නිසා මාගේ ගෞරවණීය ප්‍රණාමය ඔබ සැමට පුද කරමි.

විශේෂයෙන් දොළුව ගරු ප්‍රාදේශීය මහ ලේකම්තුමිය හා සහකාර ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුළු සේවක මණ්ඩගලයේ සියලු දෙනාට නිතර මා දිරිගන්වන්නේය. රංගධර කලායතනයේ ගුරු මෑණියන් ඇතුළු සියලු දෙනා ද ආදරයෙන් සිහි කරන අතර ඔබ සැමට පුදමි තුති මල් හදවතින් සැමදා..

මාගේ තුන්වන පොත වන "අපි නැගිටමු" පුදමි
බැතියෙන් ඔබ සැමට



AMP Print Shop

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදු කරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත් කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමු කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරු භවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධිර<br>
විදුහල්පතිනිය<br>
මහාමායා බාලිකා විද්‍යාලය



AMP Print Shop

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණ ශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතු වීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබා දෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැප වූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී. එස්. අභයකෝන්,<br>
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත.<br>
සම්මානිත මහාචාර්ය,<br>
පේරාදෙණිය විශ්ව විද්‍යාලය.<br>
2026-05-10



AMP Print Shop

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැප වූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථ කරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10



AMP Print Shop

මහ වැස්ස නිසා ගංවතුරින් හා නායයෑම්වලින් යාළුවෝ හැමෝගේ ම ගෙවල් කැඩුණා. යාළුවෝ, එයාලාගේ අම්මලා, තාත්තලා බේරුණා. සමහර අය පස් කඳුවලට යට වුණා.





AMP Print Shop


හැමෝ ම හිටියේ පන්සලේ පසු දින රූපවාහිනී නාලිකාවල අය විස්තර අහන්න, දුෂ්කර මාර්ගවලින් ම දවල්, පන්සලට ආවා. වැඩිහිටියෝ හරි ම දුකින්. ඒත් ළමයි හිටියේ ටිකක් සතුටින්.





AMP Print Shop

ඒකට හේතුව ඒ නැන්දලා මාමාලා ළමයින්ගෙන් ඇසුවා. එතකොට ළමයි කීවේ පුදුම හිතෙන දෙයක්





AMP Print Shop

අපිට ගෙවල් නැති වුණා තමයි.
ඒත්, පාසල්, දහම් පාසල් නැති
වුණේ නෑනේ.





AMP Print Shop


ඔව්, එතකොට අක්කලාට, අයියලාට ඉගෙන ගන්න පුළුවන් චීත්, අපිට?





AMP Print Shop


ඉතිං, ඔයාලගේ පෙර පාසල තියෙන්නේ පන්සලේනේ.






AMP Print Shop

# මේ, මට මතකයි අපි අර කඳවුරේ ඉන්නකොට රූපවාහිනියේ දාලා පෙන්නුවා ලෝකය සහ ලෝකයෝ එක






AMP Print Shop




ඔව්, ඒකේ නෙදර්ලන්තයේ ගංවතුර අනතුරු නැති කරන උපක්‍රම පෙන්නුවා. ශ්‍රී ලංකාවත් එහෙම හදන්න ඕන. උපක්‍රමශීලීව වැඩ කරන්න ඕන.




AMP Print Shop

ගුවන් යානාවන් කීයක් ආවාද?
ඇවිත් මෙහෙ ඉන්න අයට
කොච්චර උදව් කළා ද?





AMP Print Shop



අපිට කෑම, බීම ලැබෙනවා.
ඇඳුම් පැළඳුම් ලැබෙනවා.



AMP Print Shop






AMP Print Shop




අපිට තියෙන්නේ හොඳට ඉගෙන ගන්න.



AMP Print Shop

ඉගෙනගෙන ලොකු වෙලා කරුණාවන්ත අය වෙන්න. යාළුවෝ නාලිකාවෙන් ආපු අයට කියලා දුන්නා.





AMP Print Shop

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි. විදුහල්පතිනිය, මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, ගුරු භවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)



AMP Print Shop